මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/05-2022 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2022.12. 27 |

**අයවැය චක්‍රලේඛ අංකය: 09/2022**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**2023 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය**

**01. වියදම් දැරීම සඳහා අධිකාරී බලය**

2022 අංක 43 දරන විසර්ජන පනත 2022.12.08 දින පාර්ලිමේන්තුවේ සම්මතවී ඇති අතර එම පනත මඟින් වෙන් කර ඇති සීමාවන්ට යටත්ව 2023 වර්ෂය සඳහා වියදම් දැරීමට හැකි වන පරිදි ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් බලය ලබා දෙමින් අදාළ අධිකාරී බලපත්‍ර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) අනු-ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මුදල් විෂයය භාර අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.

ඒ අනුව, 2023 වර්ෂය තුළ ගෙවීම් වවුචර්පත් හා අදාළ වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

(අ). සාමාන්‍ය පොදු සේවා සඳහා - 2023 අංක 1 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය
(ආ). විශේෂ නීති සේවා සඳහා - 2023 අංක 1 දරන විශේෂ නීති අධිකාරී බලපත්‍රය
(ඇ). අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2023 අංක 1 දරන අත්තිකාරම් බලපත්‍රය

**02. රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් කළමනාකරණ වගකීම**

මුදල් රෙගුලාසි 127 අනුව සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් තමා යටතේ වන ආයතනවල මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සම්බන්ධයෙන් මුදල් ඇමැතිවරයාට වගකිව යුතු වේ. එසේම, 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 05 ඡේදයේ 05.1 උප වගන්තියේ සහ 2023 වර්ෂයට අදාළ විස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල පූර්විකාවේද අවධාරණය කර ඇති පරිදි වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාකරණය කර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ, ගණන්දීමේ නිලධාරීන්ගේ මෙන්ම විෂයභාර නිලධාරීන්ගේ ද වගකීම බව තරයේ අවධාරණය කරමි.

## 03. 2023 වර්ෂයේ රාජ්‍ය වියදම් කළමනාකරණය

පවත්නා අර්බුධකාරී ආර්ථික තත්ත්වය හේතුවෙන් 2023 වර්ෂයේදී රජයේ වියදම් දැරීම අන්කවරදාටත් වඩා විචක්ෂණශීලීව සිදු කළ යුතුය. එහිදී රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් දැනටමත් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි සහ රජයේ ආයතන විසින් විවිධ උත්සව සඳහා දරනු ලබන වියදම් අත්හිටුවීම මැයෙන් නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 08/2022 හි සඳහන් උපදෙස් සහ ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද අංක PS/SB/Circular/10/2022 හා 2022.08.15 දිනැති **චක්‍රලේඛ විධිවිධාන තවදුරටත් දැඩි ව පිළිපැදිය යුතු බව අවධාරණය කරමි.**

වර්ෂය තුළ වියදම් දැරීමේදී පහත සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙළට කටයුතු කළ යුතු වේ.

(අ). අනැති බිල්පත්/වගකීම් නිරවුල් කිරීම,
(ආ). අත්‍යවශ්‍ය කටයුතු පවත්වාගෙන යාම
(ඇ). අවසන් කිරීමට ආසන්න වැඩ කොටස් නිම කිරීම,
(ඈ). දැනට අර්ධ වශයෙන් නිමවා ඇති වැඩකොටස්වල ආරක්ෂාව තහවුරු කිරීම සහ ජනතාවට සිදුවන අපහසුතා මගහැරවීම පිණිස තාවකාලික පිළියම් යෙදීම
(ඉ). නව බැඳීම් සම්බන්ධයෙන් වන වියදම්

## 04. බැඳීම් කළමනාකරණය

2023 වර්ෂය තුළ නව බැඳීම්වලට එළැඹීමට පෙර 2022 වර්ෂයට අදාළ වූ ගෙවිය යුතු බිල්පත් පවතී නම් එම ගෙවීම් නිරවුල් කළ යුතු ය. සෑම වියදමක් සම්බන්ධයෙන්ම බැඳීම් ඇති කර ගැනීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පවතින බව තහවුරු කර ගත යුතු ය. නිරවුල් නොවූ වගකීම් එක්රැස්වීම හේතුවෙන් රජය මෙන්ම කොන්ත්‍රාත්කරුවන්/සේවා සපයන්නන් අසීරුතාවයන්ට පත්වීම වැළැක්වීම සඳහා ප්‍රතිපාදන වෙන්වී තිබුණද බැඳීම් ඇතිකර ගැනීමට ප්‍රථම අක්මුදල් ලබාගැනීමේ හැකියාව තහවුරු කරගැනීම වැදගත් වේ.

ඒ අනුව, 2023 වර්ෂය සඳහා රු. මිලියන 500 ට වැඩි හෝ වර්ෂ කිහිපයක් තුළ ගෙවීම් කිරීමට සිදුවන ආකාරයේ මුළු පිරිවැය රු. මිලියන 1,000 ට වැඩි ප්‍රාග්ධන වියදම් අයිතම සම්බන්ධයෙන් වගකීම්වලට එළැඹීමට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි එකඟතාවය ලබා ගත යුතු ය. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පොරොත්තු ලේඛනයක් නඩත්තු කිරීමටත් ස්වකීය මූල්‍ය තත්ත්වය හා ප්‍රමුඛතාවය අනුව එම දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාදීමටත් කටයුතු කරනු ඇත.

අයවැය ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව ඇති කර ගනු ලබන බැඳීම් සඳහා භාණ්ඩාගාරයේ වගකීමක් නොමැති බැවින් එවන් වියදම් සඳහා අදාළ නිලධාරීන් පෞද්ගලිකව වගකිව යුතු වේ.

## 05. දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන පැවරීම (මු. රෙ. 208)

රේඛීය අමාත්‍යාංශ විසින් තම විෂයපථයට අයත් කාර්යයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සිදුකරගැනීමේදී එම කාර්යය ඉටුකිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි අදාල වසරේ අවසාන කාර්තුවට ප්‍රථම ප්‍රතිපාදන පවරාදීම සිදුකළ යුතු ය.

## 06. අමතර ප්‍රතිපාදන ඉල්ලීම

පවත්නා අතිශය සීමාකාරී රාජ්‍ය මූල්‍ය අවකාශය හේතුවෙන් වියදම් ඒකක වෙත වෙන්කර ඇති ප්‍රතිපාදන ඉක්මවා අමතර ප්‍රතිපාදන ලබාදීම ඉතා අසීරු බැවින් 2023 වර්ෂය තුල පැනනගින වියදම් ලබාදී ඇති ප්‍රතිපාදන තුල හොඳින් ප්‍රමුඛතා ගත කරගනිමින් කළමනාකරණය කර ගත යුතු ය. අත්‍යවශ්‍යම කරුණක්

සඳහා පමණක් අමතර ප්‍රතිපාදන ඉල්ලීම් කරන්නේ නම් එම ඉල්ලීම් සෑම විටම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ සහිතව භාණ්ඩාගාරය වෙත යොමුකළ යුතු ය. කෙසේ වෙතත් අයවැය ඇස්තමේන්තුවල පූර්විකාවේ 3.1 හි i සිට xii දක්වා සඳහන් කර ඇති කාර්යයන්වලට අදාලව පමණක් අමතර ප්‍රතිපාදන ඉල්ලීම් සීමා විය යුතු ය.

**07. රාජ්‍ය ව්‍යාපාර විසින් ප්‍රතිපාදන ඉල්ලීම**

අයවැයෙන් වාර්ෂිකව මූල්‍යනය නොවන වාණිජමය ස්වරූපයේ රාජ්‍ය ආයතන ස්වකීය වියදම් පියවා ගැනීම සඳහා හැකි සෑම පියවරක්ම ගත යුතු අතර ආදායම් උඌනතාවය සලකා භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන ලබාදෙන මෙන් ඉල්ලීම් නොකළ යුතු ය.

**08. මු.රෙ. 66/69 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම්**

මුදල් රෙගුලාසි 66 යටතේ වන ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් 2023 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට පෙර ITMIS පරිගණක පද්ධතිය හරහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ නිළධාරීන් වෙත යොමු කළ යුතු ය.

2023.12.31 දිනට පසුව මුදල් රෙගුලාසි 69 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම සිදුකළ හැක්කේ ඒ වන විටත් ප්‍රතිපාදන ඉක්මවා ගෙවීම් කර ඇති අවස්ථාවලදී පමණක් වන අතර මුදල් රෙගුලාසි 69හි දක්වා ඇති පරිදි පූර්ව අධිකාරී බලය ලබා නොගැනීමට සෑහෙන හේතු ඉදිරිපත් කර නොතිබේ නම් එවැනි මාරු කිරීම් අනුමත නොකරන බවද අවධාරණය කරමි.

**09. අත්තිකාරම් ගිණුම් කටයුතු**

පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති සීමාවන් තුල අත්තිකාරම් ගිණුම් කටයුතු පවත්වා ගත යුතු අතර උපරිම වියදම් සීමාව වැඩිකිරීම සඳහා අවසර නොලැබෙන බැවින් වරින්වර සමාලෝචනය කරමින් මෙම සීමාවන් තුලම වියදම් කළමනාකරණය කර ගත යුතු වේ.

**10. පැහැදිලි කරගැනීම**

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරන අදාල නිළධාරියා සම්බන්ධ කරගැනීමට කටයුතු කළ යුතු ය.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව